# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1758/19 - 2012 මැයි 15 වැනි අඟහරුවාදා - 2012.05.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී 7/2001.

**1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත**

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහාචාර්ය ජී. එල්. පීරිස්,
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 මැයි මස 13 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සඳහා පුළුල් ක්‍රමෝපාය සමූහයක් නිශ්චිතව දක්වනු ලබන්නා වූ ද, විශේෂයෙන්ම ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීමට එරෙහි වන්නා වූ ද, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිය 1373 (2001) මගින් එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් වෙත ත්‍රස්තවාදය මැඩ පැවැත්වීම අරමුණු කොටගත් බැඳීම් සමූහයක් පනවනු ලැබේ. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ VII වැනි පරිච්ඡේදය යටතේ ක්‍රියාකරමින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව විසින් 2001 සැප්තැම්බර් මස 28 වැනි දින මෙම යෝජනා සම්මුතිය ඒකමතිකව සම්මත කර ගන්නා ලදී. මෙම යෝජනා සම්මුතියේ විශේෂයෙන්ම I වැනි ව්‍යවස්ථාවේ (ඇ) සහ (ඈ) ඡේද ශ්‍රී ලංකාව ඇතුළත ක්‍රියාත්මක කිරීම සඳහා සහ එමගින් ඉහත කී බැඳීම්වලට අනුකූලව ක්‍රියා කිරීමේ ක්‍රමවේදයක් සඳහා පහසුකම් සැලැස්වීම මේ නියෝගවල පරමාර්ථය වන්නේ ය.

3. මේ නියෝගවල කාර්ය සඳහා ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන නිසි බලධරයකු සිටිය යුත්තේ ය.

4. (1) මේ නියෝගවල කාර්ය සඳහා නිසි බලධරයාගේ නිර්දේශය අනුව අමාත්‍යවරයා විසින් කලින් කල තම අදහස් මත හෝ විදේශ රාජ්‍යයක ඉල්ලීම මත-

(අ) මේ නියෝගවල අර්ථානුකූලව යම් ත්‍රස්තවාදී ක්‍රියා සිදු කරන බවට හෝ සිදු කිරීමට තැත් කරන බවට හෝ සිදුකිරීමේ දී සහභාගී වන බවට හෝ සිදු කිරීම සඳහා පහසුකම් සලසන බවට විශ්වාස කිරීම සඳහා නිසි බලධරයාහට සාධාරණ හේතු ඇති යම් ස්වාභාවික තැනැත්තන් නම් කිරීම

(ආ) මේ නියෝගවල අර්ථානුකූලව යම් ත්‍රස්තවාදී ක්‍රියා සිදු කරන බවට හෝ සිදු කිරීමට තැත්කරන බවට හෝ සිදු කිරීමේදී සහභාගී වන බවට හෝ සිදු කිරීම සඳහා පහසුකම් සලසන බවට විශ්වාස කිරීම සඳහා නිසි බලධරයා හට සාධාරණ හේතු ඇති යම් නෛතික තැනැත්තන්, කණ්ඩායම් හෝ අස්ථිත්ව නම් කිරීම ;

(ඇ) ඉහත (අ) සහ (ආ) ඡේදවල සඳහන් ස්වභාවික හෝ නෛතික තැනැත්තන්, කණ්ඩායම් හෝ අස්ථිත්ව එකක් හෝ වැඩි ගණනක් විසින් සෘජුව හෝ වක්‍රව අයිතිය දරනු ලබන හෝ පාලනය කරනු ලබන යම් නෛතික තැනැත්තන්, කණ්ඩායම් හෝ අස්ථිත්ව නම් කිරීම ;

(ඈ) ඉහත (අ) හා (ආ) ඡේදවල සඳහන් ස්වාභාවික හෝ නෛතික තැනැත්තන්, කණ්ඩායම් හෝ අස්ථිත්ව එකක් හෝ වැඩි ගණනක් වෙනුවෙන් හෝ ඒවායේ විධාන මත ක්‍රියා කරන ස්වාභාවික හෝ නෛතික තැනැත්තන්, කණ්ඩායම් හෝ අස්ථිත්ව නම් කිරීම ;

කරනු ලැබිය යුතු ය.

(2) ස්වාභාවික තැනැත්තන්, නෛතික තැනැත්තන්, කණ්ඩායම් හෝ අස්ථිත්ව නම් කිරීමෙන් පසුව, නිසි බලධරයා විසින්, (මෙහි මින්මතු "ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) නම් කරන ලද සියලු තැනැත්තන්ගේ ලැයිස්තුවක් සකස් කරනු ලැබිය යුතු ය. එම ලැයිස්තුව වහාම *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිසි බලධරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය. ඒ ලැයිස්තුව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මෙහි මින්මතු නිශ්චිතව දක්වනු ලබන විධිවිධානවලට අනුකූලව (2) වැනි ඡේදය ප්‍රකාර සකස් කරනු ලබන ලැයිස්තුව නිසි බලධරයා විසින් සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම කරනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් කරනු ලබන යම් නම් කිරීමක්, අදාළ යම් තැනැත්තන්ට, කණ්ඩායම්වලට සහ අස්ථිත්වවලට එරෙහිව අපරාධ විමර්ශන කටයුතු පැවතීම හෝ නීති කෘත්‍ය විභාග වෙමින් පැවතීම හෝ නොසලකා එම අදාළ තැනැත්තන්, කණ්ඩායම් සහ අස්ථිත්ව සම්බන්ධයෙන් යම් අදාළ ප්‍රභවයකින් ලබාගත් ඉතා නිවැරදි තොරතුරු හෝ දේ මත පදනම් විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ස්වාභාවික හෝ නෛතික තැනැත්තන්, කණ්ඩායම් හෝ අස්ථිත්ව ඵලදායී සහ නිවැරදි ලෙස හඳුනාගැනීමට හැකිවනු පිණිස ඒ ස්වාභාවික හෝ නෛතික තැනැත්තන්ගේ, කණ්ඩායම්වල හෝ අස්ථිත්වවල නම් සමඟ ප්‍රමාණවත් විස්තර ඇතුළත් කර ඇති බවට තහවුරු කිරීම සඳහා නිසි බලධරයා විසින් හැකි සෑම පියවරක්ම ගනු ලැබිය යුතු ය.

(6) (2) වැනි ඡේදය ප්‍රකාර *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ලැයිස්තුව සඳහන් නම් රඳවා තබා ගැනීම සඳහා හේතු ඇති බව සහතික කරගනු පිණිස නිසි බලධරයා විසින්, ඒකාකාර කාල පරාස අනුව සහ අවම වශයෙන් සෑම වසරකට එක් වරක්වත් ඒ ලැයිස්තුව සමලෝචනය කිරීම සඳහා කටයුතු සැලැස්විය යුතු ය.

(7) ලැයිස්තුවට යම් නමක් හෝ නම් ඇතුළත් කිරීමට හෝ ඒ ලැයිස්තුවෙන් යම් නමක් හෝ නම් ඉවත් කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී, එය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබ ඇති ලැයිස්තුව සංශෝධනය කිරීම මගින් කරනු ලැබිය යුතු ය. ඒ සෑම සංශෝධනයක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

(8) යම් තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් නම් කිරීම සඳහා සලකා බලමින් පවතින බවට හෝ නම් කිරීම සඳහා කටයුතු කරමින් පවතින බවට හෝ නම් කිරීමට පෙරාතුව කවර හෝ අවස්ථාවක ඒ තැනැත්තාට, කණ්ඩායමට හෝ අස්ථිත්වයට කිසිම තැනැත්තකු විසින් දැන්වීමක් නොකළ යුතු ය.

5. (1) මේ නියෝගවල 4 වැනි නියෝගය ප්‍රකාර නම් කිරීමෙන් පසුව, යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිතවයක් සතු හෝ යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකුට, කණ්ඩායමකට හෝ අස්ථිත්වයකට අයිතිව තිබෙන හෝ යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් විසින් දරනු ලබන හෝ සියලු අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් නිසි බලධරයා විසින් තත්කාර්ය සඳහා කරනු ලබන නියමයක් මගින් වහාම ක්‍රියා විරහිත කරනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය නම් කරනු ලැබ ඇති තාක් කල් ඒ අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ අර්ථික සම්පත් ක්‍රියාවිරහිතව පැවතිය යුතු ය.

(2) (අ) කිසිම් තැනැත්තකු විසින්, මේ නියෝගවල 4 වැනි නියෝගය ප්‍රකාර නම් කරනු ලැබ ඇති යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් වෙත හෝ, යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකුගේ හෝ කණ්ඩායමක හෝ අස්ථිත්වයක ප්‍රතිලාභය සඳහා සෘජුව හෝ වක්‍රව යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් සහ මූල්‍ය හෝ වෙනත් ආශ්‍රිත සේවා ලබා දීම නොකළ යුතු ය.

(ආ) යම් නම් කළ තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ අස්ථිත්වයක අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හා ආර්ථික සම්පත් ලබානොදීම හෝ මූල්‍ය හෝ වෙනත් ආශ්‍රිත සේවා සැපයීම ප්‍රතික්ෂේප කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් පියවර ගැනීමට පෙරාතුව කවර හෝ විටෙක, ඒ නම් කළ තැනැත්තාගේ, කණ්ඩායමේ හෝ අස්ථිත්වයේ අරමුදල්, මූල්‍ය වත්කම් හා ආර්ථික සම්පත් සහ මූල්‍ය හෝ වෙනත් ආශ්‍රිත සේවා ලබා නොදීම සඳහා කටයුතු කෙරෙමින් පවතින බවට කිසිම තැනැත්තකු විසින් ඒ නම් කළ තැනැත්තා, කණ්ඩායම් හෝ අස්ථිත්වය වෙත දැනුම් දීම නොකළ යුතු ය.

(3) නම් කිරීමට පෙරාතුව යම් අවස්ථාවක දී හෝ (1) වැනි ඡේදය ප්‍රකාර ක්‍රියාවිරහිත කිරීමේ නියමයක් කිරීමට පෙරාතුව යම් අවස්ථාවක දී කිසිම තැනැත්තකු විසින්, යම් තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ අස්ථිත්වයක, අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් සම්බනධයෙන් ක්‍රියා විරහිත කිරීමේ නියමයක් කරනු ලැබිය හැකි බවට සහ එමගින් ඉන් පසුව එකී අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් සඳහා ප්‍රවේශවීම තහනම් කරනු ලබන බවට ඒ තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය වෙත දැනුම් දීම හෝ දැනුම් දීමට ඉඩ දීම හෝ කටයුතු සැලැස්වීම හෝ නොකළ යුතු ය.

එසේ වුව ද, ඒ අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් ක්‍රියා විරහිත කළ විගස ඒ පිළිබඳව නිසිබලධරයා විසින් ඒ තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය වෙත දැනුම්දීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(4) ක්‍රියාවිරහිත කිරීමේ නියමයක බලපෑම, ඒ අරමුදල්වල ප්‍රමාණයේ, වටිනාකමේ, පිහිටීමේ, අයිතියේ, සන්තකයේ, ගුණාංගයේ හෝ ගමනාන්තයේ යම් වෙනසක් හෝ ආයෝජන කළමනාකරණය ද ඇතුළුව ඒ අරමුදල් භාවිතා කිරීම හෝ ඒ අරමුදල් සම්බන්ධයෙන් ගනුදෙනු කිරීම සඳහා හැකියාව ලැබෙන වෙනත් යම් වෙනසක් ඇති විය හැකි යම් ආකාරයක සංචලනයක් පැවරීමක්, වෙනස් කිරීමක්, භාවිතා කිරීමක් හෝ ගනුදෙනු කිරීමක් තහනම් කිරීම විය යුතු ය.

එසේ වුව ද, බැර කරන ලද අරමුදල් ද ක්‍රියාවිරහිත කරනු ලබන තාක් දුරට, ක්‍රියාවිරහිත කරන ලද ගිණුමකට ඒ ගිණුම මත ලැබිය යුතු පොළිය හෝ වෙනත් ඉපැයුම් බැර කරනු ලැබීමට හෝ ඒ ගිණුම් ක්‍රියාවිරහිත කරන ලද ගිණුමක් බවට පත්වීමට පෙර ඇති වූ හෝ අවසන් වූ කොන්ත්‍රාත්, ගිවිසුම් හෝ බැඳීම් යටතේ ලැබිය යුතු ගෙවීම් බැර කරනු ලැබීමට හෝ තුන්වන පාර්ශ්වයක් විසින් ඒ ගිණුමට මාරු කරන ලද අරමුදල් බැර කරනු ලැබීමට හෝ ඒ තහනම් කිරීම අදාළ නොවිය යුතු ය.

6. (1) ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මුදල් සැපයීම වැළැක්වීම සඳහා නිසි බලධරයා විසින් මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව, තමා විසින් උචිත බවට සලකනු ලබන යම් කොන්දේසි යටතේ පහත සඳහන් කාරණා සඳහා විශේෂිත බලය ලබාදීමක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය :-

(අ) 4 වැනි නියෝගයේ (2) වැනි ඡේදයේ සඳහන් ලැයිස්තුවේ ඇතුළත් කර ඇති යම් ස්වාභාවික තැනැත්තකුගේ හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකුගේ, විශේෂයෙන්ම ආහාර ද්‍රව්‍ය, බෙහෙත්, පවුලේ නවාතැන් සඳහා කුලී හෝ උකස් සඳහා ගෙවීම් සහ එම පවුලේ සාමාජිකයන්ගේ වෛද්‍ය ප්‍රතිකාරවලට අදාළ ගාස්තු සහ අයකිරීම් ඇතුළුව, අත්‍යවශ්‍ය මානව අවශ්‍යතා සඳහා ඒ ක්‍රියා විරහිත කරන ලද අරමුදල් භාවිතා කිරීම හෝ වෙනත් යම් සම්පත් සැපයීම හෝ සඳහා අවසර ලබාදීම ;

(ආ) පහත සඳහන් කාර්ය සඳහා ඒ ක්‍රියා විරහිත කරන ලද ගිණුම්වලින් ගෙවීම් කරනු ලැබීම සඳහා හෝ වෙනත් වත්කම් සපයනු ලැබීම සඳහා අවසර ලබාදීම :-

(i) බදු, අනිවාර්ය රක්ෂණ වාරික සහ ගෑස්, ජලය, විදුලි බලය සහ විදුලි සංදේශ වැනි මහජන උපයෝගීතා ගාස්තු ගෙවීම සඳහා ;

(ii) ගිණුම් පවත්වාගෙන යාම සඳහා මූල්‍ය ආයතනයක් වෙත අයවිය යුතු ගාස්තු ගෙවීම සඳහා ;

(iii) නෛතික ගාස්තු හෝ හදිසි වියදම් ගෙවීම සඳහා.

(2) ක්‍රියා විරහිත කිරීමේ නියමයකට යටත්ව ඇත්තා වූ අරමුදල් වෙත ප්‍රවේශ වීමට බලය ලබා ගැනීම සඳහා වූ යම් ඉල්ලීමක් නිසි බලධරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) බලය ලබා ගැනීම සඳහා වූ යම් ඉල්ලීමක් ලැබීමෙන් පසුව නිසි බලධරයා විසින්, ඒ ඉල්ලීම ලැබීමේ දින සිට දින තිහක් ඇතුළත නිසි බලධරයා විසින් බලය ලබාදීමක් ප්‍රදානය කිරීමට අදහස් කරන්නේ ද නැතහොත් එම බලය ලබාදීම සඳහා වූ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට අදහස් කරන්නේ ද යන්න පිළිබඳව එම් ඉල්ලීම කරනු ලබන තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. ඒ

බලය දීම ප්‍රදානය කරන ලබන අවස්ථාවක දී ඒ බලය දීම ප්‍රදානය කරනු ලබන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද, ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මුදල් සැපයීම වැළැක්වීම සඳහා අවශ්‍ය බවට නිසි බලධරයා විසින් සලකනු ලබන කොන්දේසි වන්නා වූ ඒ කොන්දේසි නිසි බලධාරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(4) නිසි බලධරයා විසින් එක් එක් අවස්ථාවෙහි අවස්ථානුගත කරුණු මත පදනම් ව, යම් බලය ලබාදීමක් ඕනෑම විටක වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

7. (1) අමාත්‍යවරයා විසින් යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් නම් කරනු ලැබ ඇති අවස්ථාවක දී සහ එවැනි යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ අස්ථිත්වයක ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති අවස්ථාවක දී එම නම් කිරීම පිළිබඳව එම ස්වාභාවික හෝ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය වෙත ලිඛිතව දැනුම් දීම සඳහා නිසි බලධරයා විසින් සියලු සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය.

(2) ඒ ලිඛිත දැන්වීමෙහි, මේ නියෝග ප්‍රකාර ඒ ස්වාභාවික හෝ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය නම් කරනු ලැබීමට බලපෑ හේතුවලට අදාළ තොරතුරු, ලැයිස්තුවෙන් ඉවත් කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය සහ ඒ ස්වාභාවික හෝ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය විසින් ඒ නම් කිරීම අභියෝගයට ලක් කළ හැකි කාර්ය පටිපාටිය පිළිබඳ තොරතුරු අන්තර්ගත විය යුතු ය.

(3) ලිඛිත දැන්වීම :

(අ) ස්වාභාවික තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තාගේ අවසන් වරට දන්නා ලිපිනයට එය තැපැල් කිරීම මගින් ; හෝ

(ආ) නෛතික තැනැත්තකු හෝ අස්ථිත්වයක් සම්බන්ධයෙන් වන විට, ශ්‍රී ලංකාව ඇතුළත පිහිටි එහි ලියාපදිංචි කාර්යාලය හෝ ප්‍රධාන කර්යාලය වෙත තැපැල් කිරීම මගින් හෝ එවැනි ලියාපදිංචි කාර්යාලයක් හෝ ප්‍රධාන කාර්යාලයක් නොමැති අවස්ථාවක දී එහි අවසන්වරට දන්නා ලිපිනයට තැපැල් කිරීම මගින් ; හෝ

(ඇ) කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට, ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ පුද්ගලිකව හෝ වෙනත් යම් ක්‍රමයකින් භාර දීම මගින්,

යොමු කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද, (1) වැනි ඡේදයේ සඳහන් තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටී නම් හෝ පිහිටා තිබේ නම්, නිසි බලධරයා විසින් ඒ තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය පදිංචිව සිටින හෝ පිහිටා තිබෙන රාජ්‍යයෙහි ආණ්ඩුව වෙත ඒ ලිඛිත දැන්වීමේ පිටපතක් යොමුකර, ලැබෙන පළමු අවස්ථාවේදීම එය භාර දෙන ලෙස ඉල්ලා සිටිනු ලැබිය යුතු ය. ඉහත (1) වැනි ඡේදයේ සඳහන් තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය සිටින හෝ පිහිටා තිබෙන ස්ථානය පිළිබඳව සොයාගත නොහැකි නම්, එවිට නිසි බලධරයා විසින්, ඒ ස්වාභාවික තැනැත්තා ජාතිකයකු වන්නේ කවර රාජ්‍යයක ද, ඒ රාජ්‍යයේ ආණ්ඩුව වෙත හෝ ඒ නෛතික තැනැත්තා හෝ අස්ථිත්වය ලියාපදිංචි වී ඇති රාජ්‍යයේ ආණ්ඩුව වෙත හෝ ඒ කණ්ඩායම පිහිටුවා තිබෙන රාජ්‍යයේ ආණ්ඩුව වෙත ලිඛිත දැන්වීමේ පිටපතක් යොමුකර, ලැබෙන පළමු අවස්ථාවේදීම ඒ දැන්වීම භාරදෙන ලෙස ඒ රාජ්‍යයේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිය යුතු ය.

8. (1) නම් කර ඇති සහ ලැයිස්තුවට ඇතුළත් කර ඇති යම් තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් විසින් තත්කාර්ය සඳහා නිසි බලධරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මගින් නම් කිරීම අවලංගු කරන ලෙස හා ලැයිස්තුවෙන් ඉවත් කරන ලෙස ඉල්ලා සිටිය හැකි ය. ඒ ඉල්ලීම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා එහි හේතු දක්වා තිබිය යුතු ය.

(2) නම් කළ යම් තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ අස්ථිත්වයක නම් ලැයිස්තුවෙන් ඉවත් කිරීම පිළිබඳව නිසි බලධරයා විසින් අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

(3) අමාත්‍යවරයාගේ තීරණයෙන් අතෘප්තියට පත්වන යම් තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වක් විසින් එම තීරණය නිශ්ප්‍රභා කරන ලෙස ඉල්ලමින් මහාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(4) ක්‍රියා විරහිත කිරීමේ නියමය හෝ යම් අරමුදල්, වෙනත් මුල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් හෝ මුල්‍ය හෝ වෙනත් ආශ්‍රිත සේවා ලබා දීම තහනම් කිරීම හෝ බලපාන යම් තැනැත්තකු විසින් සහනයක් ලබා ගැනීම සඳහා මහාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

9. (1) 4 වැනි නියෝගයේ (2) වැනි ඡේදයේ සඳහන් ලැයිස්තුව ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව හැකි පහසු ඉක්මණින් යම් තැනැත්තකු විසින්

(අ) යම් වර්තමාන ගනුදෙනුකරුවකු හෝ තමා විසින් ව්‍යාපාර කටයුතු සිදු කර ඇති ගනුදෙනුකරුවකු හෝ වෙනත් තැනැත්තකු හෝ තමා දන්නා වෙනත් තැනැත්තකු, නම් කළ තැනැත්තකු බව හෝ නම් කළ තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කරනු ලබන තැනැත්තකු බව දැන සිටින හෝ සැක කරනු ලබන අවස්ථාවක දී, ඒ පිළිබඳව අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයා වෙත හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙත් දැනුම් දිය යුතු ය.

(ආ) පහත සඳහන් කරුණු පිළිබඳව, එනම් -

(i) අරමුදල්වල තත්ත්වය, ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ග සහ අරමුදල් සම්බන්ධයෙන් ගන්නා ලද වෙනත් යම් ක්‍රියාමාර්ග පිළිබඳව

(ii) නම් කළ තැනැත්තා වෙනුවෙන් අදාළ ආයතනය විසින් දරනු ලබන යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත්වල ස්වභාවය සහ ගණන හෝ ප්‍රමාණය හෝ නම් කළ තැනැත්තා වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරන ලද හෝ දරන ලද ගනුදෙනු ; සහ

(iii) මේ නියෝග හා අනුකූලව ක්‍රියා කිරීම පහසු කරවනු ලබන වෙනත් යම් තොරතුරක් පිළිබඳව

අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයා වෙත හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙත තොරතුරු සැපයිය යුතු ය.

(ඇ) මෙම තොරතුරු සනාථ කිරීමේ දී අවස්ථාවෝචිත පරිදි, නිසි බලධරයා හෝ මූල්‍ය බුද්ධි ඒකකය සමග සහයෝගීව ක්‍රියා කළ යුතු ය.

(2) මේ ඡේදයට අනුකූලව සපයා ඇති හෝ ලැබී ඇති යම් තොරතුරක්, ඒ තොරතුරු සපයා ඇත්තේ හෝ ලැබී ඇත්තේ යම් කාර්ය සඳහා ද ඒ කාර්ය සඳහාම පමණක් භාවිතා කළ යුතු ය. මේ ඡේදයට අනුකූලව නිසි බලධරයා හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙත සපයා ඇති යම් තොරතුරක්, යම් ලිඛිත නීතියක් මගින් හෝ අන්‍යාකාරයකින් පනවා ඇති යම් සීමා කිරීමක් උල්ලංඝනය කිරීම ලෙස සලකනු නොලැබිය යුතු ය.

10. මේ නියෝග යටතේ සහ 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ වැරදි සිදු කිරීමට අදාළව ස්වකීය දැනුම තුළ පවතින තොරතුරු මේ සම්බන්ධයෙන් ස්වකීය කාර්ය ඵලදායී ලෙස ඉටු කිරීමේ කාර්ය සඳහා කලින් කල නිසි බලධරයා සහ මූල්‍ය බුද්ධි ඒකකය විසින් හුවමාරු කරගනු ලැබිය හැකිය.

11. (1) මේ නියෝගවල 9 වැනි නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා එක් අවුරුද්දක් නොඉමක්වන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් ක්‍රියා විරහිත කිරීමේ නියමයකට අනුකූලව ක්‍රියා විරහිත කිරීම පැහැර හරින හෝ අරමුදල් ලබා දෙන හෝ මූල්‍ය සේවා සපයන හෝ 5 වැනි නියෝගයේ (4) වැනි ඡේදයේ සහ 4 වැනි නියෝගයේ (8) වැනි ඡේදයේ සඳහන් තහනම් කිරීම උල්ලංඝනය කරනු ලබන හෝ යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියනයක් නොඉක්මවන දඩ මුදලකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩ මුදල යන දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

12. (1) මේ නියෝග යටතේ වූ යම් බැඳීමක් උල්ලංඝනය කිරීමට හෝ උල්ලංඝනය විය හැකි බවට අදාළ වන යම් කාරණයක් හෝ තොරතුරක් නිසි බලධරයා, මූල්‍ය බුද්ධි ඒකකය සහ අමාත්‍යවරයා විසින්, උචිත නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ආයතන සම්බන්ධයෙන් වන විට දී, පරිපාලනමය දණ්ඩන පැනවිය යුතු ද, නැද්ද යන්න සළකා බැලීම සඳහා ඒ ආයතනවල අදාළ අධීක්ෂණ අධිකාරීන් වෙත ද යොමු කළ යුතු ය.

(2) නිසිබලධරයා විසින් නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන, මූල්‍ය බුද්ධි ඒකකය, අධීක්ෂණ අධිකාරීන් සහ වෙනත් උචිත අස්ථිත්වවල අදහස් විමසා මේ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීම අධීක්ෂණය කරීම සහ මේ නියෝගවලට අදාළ දණ්ඩන බලාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු සැළැස්මක් නිර්මාණය කරනු ලැබිය යුතු ය.

(3) නිසිබලධරයා විසින්, මේ නියෝග යටතේ වූ ව්‍යවහාර ක්‍රියාත්මක කිරීම සඳහා සහ බැඳීම් බලාත්මක කිරීම සඳහා විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

13. මේ නියෝගවල කාර්ය සඳහා

"නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් පාලනය කිරීම" යන්නෙන්, පහත සඳහන් යම් අර්ථයක් අදහස් වන්නේ ය :

(අ) ඒ නෛතික තැනැත්තාගේ, කණ්ඩායමේ හෝ අස්ථිත්වයේ පරිපාලන, කළමනාකරණ හෝ අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ බහුතරය පත් කිරීමේ හෝ ඉවත් කිරීමේ අයිතිය තිබීම ;

(ආ) හුදෙක් යම් තැනැත්තකුගේ ඡන්ද අයිතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, යම් නෛතික තැනැත්තකුගේ කණ්ඩායමක හෝ අස්ථිත්වයක පරිපාලන, කළමනාකරණ හෝ අධීක්ෂණ මණ්ඩලවල, වර්තමාන හෝ පසුගිය මූල්‍ය වර්ෂය තුළ දී ධුර දරන ලද සාමාජිකයන් බහුතරයක් පත් කිරීම ;

(ඇ) යම් නෛතික තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ අස්ථිත්වයක වෙනත් කොටස් හිමියන් හෝ සාමාජිකයන් සමග එළඹ ඇති ගිවිසුමක් අනුව යමින් ඒ නෛතික තැනැත්තාගේ, කණ්ඩායමේ හෝ අස්ථිත්වයේ බහුතර කොටස් හිමියන්ගේ හෝ සාමාජිකයන්ගේ ඡන්ද අයිතිය තනිවම පාලනය කිරීම ;

(ඈ) ඒ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය සමග එළඹ ඇති ගිවිසුමක් අනුව හෝ ඒ නෛතික තැනැත්තාගේ, කණ්ඩායමේ හෝ අස්ථිත්වයේ සාංගමික ව්‍යවස්ථාවලියේ ඇති හෝ සාංගමික සංස්ථා පත්‍රයේ ඇති විධිවිධානයකට අනුව, ඒ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය පාලනය කරනු ලබන නීතිය මගින් ඒ තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය ඒ ගිවිසුමට හෝ විධිවිධානවලට යටත් වීමට අවසර දෙනු ලබන විට, ඒ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය කෙරෙහි ප්‍රධාන බලය ක්‍රියාත්මක කිරීමේ අයිතිය තිබීම ;

(ඉ) (ඈ) ඡේදයේ සඳහන් ප්‍රධාන බලය ක්‍රියාත්මක කිරීමේ අයිතිය දරනු ලබන්නකු නොවී ඒ අයිතිය ක්‍රියාත්මක කිරීමට බලය තිබීම ;

(ඊ) නෛතික තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ අස්ථිත්වයක සියලු වත්කම් හෝ ඒවායින් කොටසක් භාවිතා කිරීමේ අයිතිය තිබීම ;

(උ) ඒකාබද්ධ ගිණුම් ප්‍රසිද්ධ කරනු ලබන අතරතුරදී ඒකාබද්ධ පදනමක් මත නෛතික තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ අස්ථිත්වයක ව්‍යාපාර කළමනාකරණය කිරීම ;

(ඌ) නෛතික තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ අස්ථිත්වයක මූල්‍ය වගකීම් එක්ව හා වෙන් වෙන්ව හුවමාරු කර ගැනීම හෝ ඒවා පිළිබඳ වගකීමට බැඳීම ; හෝ

(එ) නෛතික නොවන ක්‍රම ද ඇතුළුව වෙනත් ආකාරයකින් පාලනය ක්‍රියාත්මක කිරීම.

"මූල්‍ය බුද්ධි ඒකකය" යන්නෙන් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය අදහස් වේ.

"මූල්‍ය සේවා" යන්නෙන්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි "මූල්‍ය ව්‍යාපාරය" යන යෙදුමේ අර්ථානුකූලව වූ ක්‍රියාකාරකම්වල යෙදී සිටීම අදහස් වේ.

"අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හා ආර්ථික සම්පත් " යන්නෙන්, බැංකු ණය, සංචාරක චෙක්පත්, බැංකු චෙක්පත්, මුදල් ඇණවුම්, කොටස්, සුරැකුම්පත්, බැඳුම්කර, අණකර සහ ණයවරලිපි ඇතුළත්ව, එහෙත් ඒවාට සීමා නොවන්නා වූ ඕනෑම ආකාරයක ස්පර්ශ කළ හැකි හෝ ස්පර්ශ කළ නොහැකි චංචල හෝ නිශ්චල කවර හෝ ආකාරයකින් අත්කරගනු ලැබූ වත්කම් සහ විද්‍යුත් හෝ ඩිජිටල් ඇතුළු ඕනෑම ආකාරයකින් වූ ඒ වත්කම් පිළිබඳ අයිතිය සඳහා සාක්ෂි දරනු ලබන හෝ ඒ වත්කම් කෙරෙහි වන සම්බන්ධතාවය සඳහා සාක්ෂි දරනු ලබන නෛතික ලේඛන හෝ සාධන පත්‍ර අදහස් විය යුතු අතර ඊට පහත සඳහන් දේ ද ඇතුළත් වේ.

(i) එම අරමුදල්වලින්, වත්කම් වලින් හෝ ආර්ථික සම්පත්වලින් උපචිත වන හෝ ඇතිවන සියලු අරමුදල් ;

(ii) වක්‍රව අයිතිය දරනු ලබන අරමුදල්, වත්කම් හෝ ආර්ථික සම්පත් ; සහ

(iii) හවුලේ අයිතිය දරනු ලබන හෝ පාලනය කරනු ලබන අරමුදල්, වත්කම් හෝ ආර්ථික සම්පත්.

"මහාධිකරණය" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද, කොළඹ දී පවත්වනු ලබන, බස්නාහිර පළාත සඳහා වූ මහාධිකරණය අදහස් වේ.

"ආයතනය" යන්නෙන්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාව යටතේ විදේශ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ ;

"නෛතික තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ අස්ථිත්වයක අයිතිය දැරීම" යන්නෙන්, යම් නෛතික තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ අස්ථිත්වයක හිමිකාරත්ව අයිතිවාසිකම්වලින් සියයට පනහක හෝ ඊට වැඩි ප්‍රමාණයක සන්තකය දරනු ලැබීම හෝ එහි බහුතර සම්බන්ධතාවයක් තිබීම අදහස් වේ ; සහ

"ත්‍රස්තවාදී ක්‍රියාව" යන්නෙන්, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය.

06 - 50

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.